# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව

(ප්‍රවාහන, මහාමාර්ග, ආර්ථික උප ව්‍යුහයන්, වෙළඳ, නිවාස
හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය)

# 1990 අංක 03 දරන බස්නාහිර පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය

(බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය සටහන් කළේ
1990 ජූලි මස 17 වන දින දීය.)

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියම පරිදි
මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රවාහන, මහාමාර්ග, ආර්ථික උප ව්‍යුහයන්, වෙළඳ, නිවාස හා ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් මිළ දී ගත හැක.

තැපැල් ගාස්තුව : රු. 1.00

මිළ : රු. 2.50

## නිවාස සංවර්ධන අරමුදලක් පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය

**අරමුදල් නිදහස් කිරීම.**

6. භාරකාර මණ්ඩලය විසින් පළාත් සභාවේ නිවාස පිළිබඳ විෂයය භා
අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අවස්ථාවෝචිත පරිදි නිවාස යෝජනා
ක්‍රම, දුගී දුප්පත් අයට නිවාස ඉදිකිරීම සඳහා ආධාර දීම හා පළාත් සභාවේ
නිවාය පිළිබඳ අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබන අරමුදලේ මූලික
අරමුණු ඉටුකර ගැනීම පිණිස අවශ්‍ය වෙනත් කාර්යයන් සඳහා මෙම
අරමුදලෙන් මුදල් නිදහස් කිරීමට පුළුවන.

**රෙගුලාසි සකස් කර ගැනීම**

7. අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
පටහැනි නොවන පරිදි අදාළ සීමාවන් තුළ අරමුදලේ මුදල් යෙදවීමේ ක්‍රම
පිළිබඳව රෙගුලාසි සකස් කර ගැනීමේ බලය අමාත්‍යවරයා සතු වේ.

**අරමුදලේ බල ප්‍රදේශය**

8. අදාළ අරමුදලේ බල ප්‍රදේශය බස්නාහිර පළාත සඳහා පමණ
ක්‍රියාත්මක විය යුතුය. ජාතික නිවාස යෝජනා ක්‍රමවලට අනනුකූල වූව

**නිවාස ක්‍රම සකස් කිරීමේදී විමසිය යුතු අය**

9. මේ ප්‍රඥප්තියේ විධිවිධාන බලාත්මක කිරීමේ දී, අත්තම නිවාස
යෝජනාක්‍රම ඇතුළු පළාත් නිවාස යෝජනාක්‍රම සහ ව්‍යාපෘති සකස් කිරීමේ
දී අමාත්‍යවරයා විසින් බස්නාහිර පළාතේ නගරාධිපතිවරුන්, පළාත්පාල
ආයතන සභාපතිවරුන්, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ස
ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විමසිය යුතුයි.

10. මේ පනතේ '' අමාත්‍යවරයා '' යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ
නිවාය භාර ඇමතිවරයා අදහස් කෙරේ.

'' අරමුදල '' බස්නාහිර පළාත් සභාවේ නිවාස සංවර්ධන අරමුදල වේ.

## නිවාස සංවර්ධන අරමුදලක් පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය

### 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ I වන ලැයිස්තුවේ 5 වන කොටසට අනුකූලව සකස් කරන ලද ප්‍රඥප්තියකි.

ආධාර දෙනු ලබන අත්කම් නිවාස ව්‍යාපෘති, නිවාස ණය සහ ගොඩනැගිලි උපකරණ සැපයීම ඇතුළුව (ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති නොවන) පළාත්බද නිවාස සංවර්ධන වැඩ සටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම ආදී අරමුණු ඉටුකර ගැනීමට පළාත් සභාවට ඇති බලතල අනුව එකී අරමුණු ඉටුකර ගැනීම පිණිස අරමුදලක් පිහිටුවා ගැනීමට ඇතිකර ගත් ප්‍රඥප්තියකි.

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1990 අංක 03 දරන බස්නාහිර පළාතේ නිවාස සංවර්ධන අරමුදල පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්වෙන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන නියමයක් මගින් නියම කරනු ලබන දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය. — ලුහුඩුනාමය හා ක්‍රියාත්මක වන දිනය ✓

2. රුපියල් පත්ලක්ෂයක පළාත් සභා අරමුදලින් ලබාදෙන මුදලකින් අරමුදල ආරම්භ කළ යුතුවේ. — ආරම්භක මුදල

3. එසේම මේ අරමුදලට බැරකර නිවාස සංවර්ධන අරමුණු සඳහා මුදල් ප්‍රදානය කිරීමට කැමති ජනතාවට හෝ එවන් මහජන ආයතනවලට හෝ මොන ආකාරයට හෝ කෙළින්ම මේ අරමුදලේ ගිණුමට බැර කර එවන සියළුම මුදල් මෙම අරමුදලේ මුදල් වේ. එසේම අරමුදලට එන සියලුම ආදායම්වල මුදල් අරමුදලේ මුදල් වේ. — අරමුදලේ මුදල්

4. මෙම අරමුදල ලංකා බැංකුවේ ගිණුමක් මගින් පවත්වාගෙන යා යුතුය. මෙම අරමුදලේ මූලික අරමුණු ඉටුකර ගැනීම පිණිස මෙම මුදල් ප්‍රයෝජනයට ගත යුතුය. — අරමුදල පවත්වා ගෙනයැම

5. අරමුදල පරිපාලනය සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් නිවාස පිළිබඳ විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් පත් කළ යුතුවේ. එම මණ්ඩලය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. — අරමුදලේ පරිපාලනය

(1) පළාත් සභාවේ නිවාස විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා (සභාපති) ; ✓

(2) පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නිර්දේශ කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙකු ; ✓

(3) පළාත් සභාවේ මූල්‍ය කළමණාකරණය පිළිබඳ නියෝජ්‍ය ලේකම්. ✓